දිනමිණ සිළුමිණ The Silumina epaper

# ඇබෑර්තු

IWWRMP

# මූල්‍ය කළමනාකරු

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## වාරිමාර්ග අමාත්‍යංශය

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) ලෝක බැංකුව විසින් අරමුදල් ප්‍රතිපාදිත වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 2025 ඔක්තෝබර් මස වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘතියකි.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 හා රජයේ බඳවාගැනීමේ ක්‍රියාපටිපාටිය පරිදි "කොන්ත්‍රාත් පදනම" මත පූර්ණකාලීනව සේවය කිරීමට කොළඹ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මූල්‍ය කළමනාකරු (PS3 කාණ්ඩය) තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**පහත i, ii හෝ iii**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක් සමග කළමනාකරණ මට්ටමේ අවම වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමාකළ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක් සමග කළමනාකරණ මට්ටමේ අවම වසර 8 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

iii. රජයේ දීපව්‍යාප්ත සේවයේ 1 වන පංතියේ නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක් සමග 1 වන පංතියේ තනතුරක අවම වසර 03 ක පළපුරද්ද.

**වැටුප් මට්ටම** : PS3 කාණ්ඩය රු. 140,000.00 - 155,000.00 (MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි)

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරුවන් අවම 21 හැවිරිදි හා අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.
2. වැටුප් පරිමාණය : රජයේ අනුමත වැටුප් පරිමාණයන් සමග කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) අංක 01/2019 හා 15-03-2019 දතම දරන චක්‍රලේඛය සහ ඉන්පසු සිදුවූ වෙන යම් සංශෝධන පරිදි දීමනා.
3. රැකියා කොන්ත්‍රාත්තුව වසරක් වන අතර කාර්ය සාධනය හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත පදනම්ව වාර්ෂිකව නැවත සේවා කාලය දීර්ඝ කරනු ලැබේ.
4. ඔහු/ඇය අදාළ රජයේ ආයතන සහ අනෙකුත් නියෝජිතායතන හා සමග සම්බන්ධීකරණයෙන් තම රාජකාරී ඉටු කළ යුතුය.
5. ශ්‍රී ලංකාව තුළ ලෝක බැංකු/ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල වැඩ පළපුරුද්ද අත්‍යාවශ්‍යය.
6. ඉංග්‍රීසි භාෂාවේ නිපුණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ මනා දැනුම හා පරිගණක සාක්ෂරතාව, තනතුර සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වේ.
7. දිගු වේලාවන් හා සති අන්තයන්හි සේවය කිරීමට ඇති හැකියාව.
8. තරුණ, උද්යෝගිමත් හා කඩිසර අයදුම්කරුවන් අයදුම් කිරීම සඳහා දිරි ගැන්වේ.

තම සම්පූර්ණ ජීව දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සහිත අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට 2023 දෙසැම්බර් 27 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය. මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පත, අයදුම්කරන තනතුර විෂය පථයෙහි සඳහන් කොට iwwrmp@sltnet.lk විද්‍යුත් තැපැලට යොමු කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය** (IWWRMP)
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**නො.96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**

**වෙබ් අඩවිය :** www.iwwrmp.lk

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යංශය.**